# සිරිත් මල්දම ( 1 කොටස )

01. මහත් සෙත් වඩවන
සිරිත් මල්දම බලමින
සිරිත් හොඳ දැනගෙන
මහත් යසසිරි ලබනු දෙලොවින

02. හොඳ ලෙස හැදීමට
හොඳ සිත ඕනෑ හැම විට
නරක සිත් ඇති විට
නරකමයි සිදු වන්නෙ අපහට

03. නරක සිතකින් නම්
හොඳක් නොකළැකි කිසියම්
හොඳක් නොකළේ නම්
උපන් ගතියෙන් නැත පලක් නම්

04. පව් නම් නරක මය
එයින් දෙලොවෙහි දුක මය
පින් නම් උතුම් මය
එයින් දෙලොවෙහි මහත් සැප මය

05. තමන් පණ ලෙස හැම
සතුන් ගැන සළකා පෙම
ඔවුන් දුටු විලසම
කරන් ආදර ගුණය නොහැරම

06. සෙල්ලම් සිතින් වත්
යම්කිසි තරහකින් වත්
මරන සිතකින් වත්
සතුන්හට වදදීම නොහොබිත්

07. නොමින් දුක විඳිමින
අනුන් සෙව් දන මිල දැන
හොරෙන් නො ගනුව පැන
සිතන් කැබිලිති ලෙසින් ඒ ගැන

08. අනුන්ගෙන් නැති උන
දෙයක් ලැබුණොත් යම් දින
එය සඟවා නොගෙන
දෙන්ට කරුණා කරන් සතුටින

09. කුණු සරුප නොකියනු
කේලම් වචන නොකියනු
විහිලු බොරු නොකියනු
ඇනුම්පද කිසිවෙකුට නොකියනු

10. බොරු කීම කැතමය
ගැරඬි කුණටත් නොසමය
ඇත්ත නම් කදිමය
මෙලොව රජ සැපතටත් උතුමය

11. අතින් අත බැඳ පෙළ
නොයන් මංමාවත්වල
තැනින් තැන කඩවල
නොයන් කරුණක් නැතිව කිසි කල

12. තැනින් තැන ගෙන් ගෙට
ගොසින් බලමින් වට පිට
අනුන් කන බොන විට
ලොබින් නොයිදින් නැතත් කෑමට

13. දනන් නිති ගැවසෙන
තැනින් කුඩ ඉසලාගෙන
සැරෙන් බස් කියමින
ගමන් නොකරන් උඩඟු විලසින

14. පාරෙ යන එන විට
අයින් වීමෙන් දකුණට
දුව පැන දඟ නොකොට
ගමන් කළ යුතුය කී හැම විට

15. යම් කිසි ගෙදරකට
ගිය කල ඕනෑ කමකට
ඔවුන් නොම දැක ගෙට
ඇතුල් නොමවන් නො හොබි සිරිතට

16. සුදු කෙළි පලකට
කොලහල කෙරෙන තැනකට
තැබෑරුම් පලකට
යාම හොඳ නැත බලා ඉඳුමට

17. නාඩගම් බැලුමට
විහිලු කෝලම් බැලුමට
යක් තොවිල් බැලුමට
නොයන් නොහොබින එවැනි තැනකට

18. අව්වෙහි ගොසින් වත්
සෙල්ලම් කිරීමෙන් වත්
වෙහෙස වී සිටියොත්
නො බොනු ඇල්දිය තිබහ තිබුනත්

19. අඟුරු හුණු කැට ගෙන
විහිලු නො ලියනු තැන තැන
බිත්ති කණු කිසි තැන
යමක් නො ලියනු අයුතු විලසින

20. ගුරු බස සැබෑමය
එය පිළිගැනුම යුතුමය
පඬි බසත් එයමය
එයින් දෙලොවෙහි මහත් සැපමය

21. ගුරුවරු කිසිම විට
සතුටු නොම වෙති තැළුමට
හොඳින් එය සිහි කොට
වැරදි නො කරන් තැළුම් කෑමට

22. තක්කඩි කම් කළොත්
දඬුවම් දෙති සැක නැත්
දඬුවම් නුදුන්නොත්
ළමයි කිසි කළ හොඳින් නො හැදෙත්

23. වැරදි කළ අය හට
දඬුවම් දෙන්නේ හැදුමට
හැදෙන අය එම විට
හොඳින් කීකරු වෙති නැමී සිට

24. ඉර උදා වෙන්නට
පළමුව නැඟිට සිහිකොට
අලසකම් දුරුකොට
කරන් වැඩ පල දියුණු වන්නට

25. ගෙදොර අතුගෑමෙන
මූණ කට සෝදා ගෙන
ඔළුව පීරාගෙන
අකුරු පාඩම් කරනු සතුටින

26. අත පය සෝදා ගෙන
නරක කෑමක් නොමගෙන
හොඳ දෙයක් කෑමෙන
සැරසෙන්න පාසලට යන මෙන

27. කිලිටු රෙදි බැනියම්
ඇඳුම් නාඳිනු කිසියම්
පිරිසිදු නිසි ඇඳුම්
අඳින් හැම කල නුඹට ඇත්නම්

28. දිග නියපොතු වැඩුණු
තිබුම හොඳ නෑ කප්පනු
දත්පෙළ කුණු බැඳුණු
පෙනෙයි කැත ලෙස හොඳින් සෝදනු

29. සෙම් සොටු පෙරාගෙන
කුණු කෙළ වගුරුවා ගෙන
දැලිකුණු තවරැ ගෙන
ඉඳුම කැත ලෙස පෙනෙයි බැලු තැනු

30. හිස අවුල් කරගෙන
කිලුටු වැරහැලි ඇඳගෙන
පඹයකුගේ විලසින
ඉඳුම හොඳ නෑ බූත කරමින

31. තම දෙවියන් නැමද
මව්පිය දෙදෙන දැක වැඳ
ගුරුන් වෙත ගොස වැඳ
අකුරු නිසි ලෙස ඉගෙන ගනු සොඳ

32. පාසලට යන එන
අතර මගදී කිසිතැන
කොලහල නොකරමින
ගමන් කරපන් සිල්වතකු මෙන

33. තම පොත් පත් රැගෙන
නියම තැන්වල ඉඳගෙන
ගෝසා නොකරමින
කරනු පාඩම් සිතට ගනිමින

34. පාසලෙහි තැන තැන
නොයන් දුවමින් බලමින
දඟ නොකර ඉඳගෙන
ගුරුන් කී දෙය කරන් එලෙසින

35. අනුන්ගේ පොත් පත්
නාදිනු නොගනු කිසිවක්
උවමනා කළහොත්
කියා ඉල්ලා ගැනුම යහපත්

36. ගල්ලෑලි පොත් පත්
පෑන් පැන්සල් සැවොමත්
තම සැලකුම ඇතොත්
තමන් ගාවම තිබෙයි සැක නැත්

37. ගල්ලෑලි පොත්වල
විහිලු නොලියනු කිසිකල
පිරිසිදුව හැම කල
තබනු පොත් පත් සියලු දේපල

38. පාසලෙහි තැන තැන
කෙල නො ගසන් නොහොබි දැන
සෙම් සොටු සුරමින
මිදුලෙහිද නො දමන් කිසි තැන

39. සිඟා කා ගෙන වත්
කිලුටු වැරහැලි ඇඳ වත්
බිම වැටී ඉඳ වත්
මහත් සැපවෙයි ඉගනෙ ගතහොත්

40. මවු පිය රවටලා
නො ගනින් කිසිත් ඉල්ලා
මව් පියන් වැඳලා
ගනින් ඕනෑ යමක් ඉල්ලා

41. දෙගුරුන්ට හිරිහැර
නොකරන් කිසිත් කරදර
පින් සිදුවෙයි නිතර
කරන් ආදර ගුණය හැමවර

42. පියාට ඉහළින් නොයිදින් කිසි තැන
මව්හට ඉහළින් නොයිදින් කිසි තැන
අයියට ඉහළින් නොයිදින් කිසි තැන
අක්කට ඉහළින් නොයිදින් කිසි තැන

43. අයියාට නොබනින් නොගහන් තරහට
අක්කට නොබනින් නොගහන් තරහට
මල්ලිට නොබනින් නොගහන් තරහට
නංගිට නොබනින් නොගහන් තරහට

44. අයියට අක්කට දෙගුරුන් දුන් දෙය
මල්ලිට නංගිට දෙගුරුන් දුන් දෙය
ලොබ කොට තරහට නොබලන් ඒ දෙය
හැමවිට සතුටට පැමිණෙත් ලත් දෙය

45. ආතාට මුත්තට වැන්දට පව් නැත
මාමට නැන්දට වැන්දට පව් නැත
අයියට අක්කට වැන්දට පව් නැත
මොවුනට වැන්දට කදිමට පින් ඇත

46. කරුණාවට කී බණ අහපන්නේ
මැර ගතියට හෙම දුරු නොකරන්නේ
හොඳ සිරිතට මග පඩි බස වන්නේ
ජය ලැබුමට එම බස අරගන්නේ

47. පොර බදමින් නැමට නොසිතන්නේ
දුව හැපෙමින් වතුරට නොපනින්නේ
ගැඹුරු දියෙන් නැමට නොවදින්නේ
තනිව ගොසින් නැමට නොසිතන්නේ

48. ගෙඩි කැඩුමට ගස්වලට නොයන්නේ
ගිනි තැපුමට හෙම පුරුදු නොවන්නේ
නිදා ගන්නට දහවල් නොසිතන්නේ
වැඩ කෙරුමට මැලිකම් නොකරන්නේ

49. සුරුට්ටු බීමට පිරිය නොවන්නේ
දුම්කොළ හැපුමට පුරුදු නොවන්නේ
බුලත් විකීමට සතුටු නොවන්නේ
මේ ගති හැදුමට නොහොබි සිතන්නේ

50. කෑමට කෑදරකම් නොකරන්නේ
තවමට කියමින් කෑ නොගසන්නේ
තරහට කෑමක් විසි නොකරන්නේ
එළිපිට හිටගෙන කෑම නොකන්නේ

51. කෑමට අත දමමින් නොමගන්නේ
කනවිට කෑත ලෙස තලු නොගසන්නේ
කිසිවිට අඬමින් කෑම නොගන්නේ
හැමවිට සතුටින් ඉඳ කාපන්නේ

52. ආප්ප කැවුමත් ණයට නොගන්නේ
අරගෙන කමිනුත් පාරෙ නොයන්නේ
පිළිකුල් සිතුනොත් කෑම නොකන්නේ
රසයක් ලැබුනොත් තනිව නොකන්නේ

53. වතුරට මළමු විසි නොකරන්නේ
අතකට සෝදා ගෙයි නොදමන්නේ
තෙමෙන්ට ඇඟිලි බදුනෙහි වන්නේ
බීමට යමකුට වතුර නොදෙන්නේ

54. යකෝ යන බස් නොහොබි සිතන්නේ
ඌ මූ යන බස් කැතැයි අසන්නේ
කෝ බොල යන බස් දුරු කරපන්නේ
පිරිය වඩන බස් පවසාපන්නේ

55. වැඩ ඇති විට අතපසු නොකරන්නේ
අද දවසට වැඩ අද කරපන්නේ
හෙට දවසට හෙම කල් නොදමන්නේ
නිසි කාලෙට නිසි වැඩ කරපන්නේ

56. සෙල්ලම් කරමින් දඹර නොවන්නේ
නොතරම් වචනින් බැන නොම ගන්නේ
සෙල්ලම් කෙරුමෙන් වැඩ නො නසන්නේ
සෙල්ලම් විලසින් කල් නොයවන්නේ

57. සොහොයුරුවන් සහ දඹර නො වන්නේ
පරුස බසින් බැණ පව් නොම ගන්නේ
තරහ වෙමින් ඌ මූ නො කියන්නේ
එකතු කමින් හොඳ වැඩ කරපන්නේ

58. ළමයින් දුටුකල පොරට නො යන්නේ
කරමින් කොලහල බණ නොම ගන්නේ
දෙවියන් ඉර හඳ මවු පිය වැන්නේ
කියමින් කිසිකල නොම දිවුරන්නේ

59. හවසම නින්දට පුරුදු නොවන්නේ
උදයට නින්දෙන් නැගිට සිටින්නේ
ආගම අදහන සිහි කර ගන්නේ
නො හැර ම වැඩ පල බලා ගනින්නේ

60. මහත් වැඩක් තව කියමි අසන්නේ
පහත් ව පාලඟ දෙමව්පියන්නේ
මහත් දයාවෙන් ගෙන දෝතින්නේ
බුලත් අතක් දී වැඳ සිටපන්නේ

61. ළමා කමට නිසි වැඩ කරපන්නේ
තරුණකමට හෙම සිත නොම ගන්නේ
යටත් කමට සිත ගෙන හැදියන්නේ
උසස් බවට පැමිණෙයි නිසැකින්නේ

62. මිතුරු සැප වේවා
සතුරු දුක් දුරු වේවා
ඉසුරු වැඩි වේවා
ළදරු පෙළහට ජයක් වේවා

# සිරිත් මල්දම ( 2 කොටස )

01. සැමට සෙත් වඩවන
සිරිත් මල්දම බලමින
සිරිත් හොඳ දැනගෙන
මහත් යසසිරි ලබනු දෙලොවින

02. හොඳ නොහොඳ දෙක මය
හොඳ නොහොඳ අයගෙන් මය
ගඳ සුවඳ දෙක මය
ගඳ සුවඳ එම දෙයින්වනු මය

03. නපුරු අය සමගින
මිතුරු නොමවන් කිසිතැන
රුදුරු නයි විස මෙන
ඇසුරු නොකරනු සොඳින් දැනගෙන

04. තම නිවසට පැමිණි
සැම දෙනහට ම කුලුණෙනි
කතා බස් කරමිනි
අසන් තොරතුරු සුදුසු විදියෙනි

05. ඇනුම් පද නොකියමි
බැනුම් කැත බස් නො කියමි
නිකම් බස් නො කියමි
තරම් පමණට වදන් තෙපලමි

06. හිසකේ කැපීම ද
ඉන්න තැන කෙල ගැසුම ද
නියපොතු විකීම ද
අසුබ ලකුණුය සිතන් හැම සඳ

07. සිනා හඬ ලීමෙන
කතා නොකරනු කිසි තැන
කවට බස් කියමින
උතුම් අය ළඟ කතා නැත ගුණ

08. කතා බස් කරමින
සිටින දෙදෙනකු අතරෙන
ගමන නොහිඹී යන
වසනු යහපති එබව දැනගෙන

09. උරුවන් බබා වත්
සිව්පද කියා ගෙන වත්
සින්දු කියමින් වත්
ගෙවල් අසලින් යාම නොහොබිත්

10. යමෙකු යන එන විට
සිනා නො ම සෙන් කිසි විට
පැමිණි කල ගෙදරට
එබී නොබලනු සැභවී ගෙයි සිට

11. යමක් නො ම ඇසූ විට
උත්තර නොදෙනු පරහට
නුඹෙන් ඇසූ යමකට
දෙනුව උත්තර හොඳින් සිහිකොට

12. ගුරුන් දෙගුරුන් වත්
වැඩිහිටි අන් කෙනකු වත්
කතාවක් කළහොත්
නැඟිට උත්තර දීම යහපත්

13. මවු පිය දෙදෙන වත්
තමන් ගුරුවරයින් වත්
නුඹෙ වරද ඇසුවොත්
නො සඟවා එය කියනු යහපත්

14. මව්පියෝ උතුම් මය
අපගෙ පෙර දෙවිවරු මය
අප රකිනුවෝ මය
වඳිමු මව්පිය දෙදෙන මහිමය

15. සියලු යස ඉසුරට
සරිලු නිසි මගපෙම් කොට
බැබලු පිය රුවනට
සියලු තන්හිම වඳිමු සිහිකොට

16. ගියත් ගම් රටවල
මහත් දුක් ඇත සිත තුළ
වඩත් දරු පෙම් බල
අපිත් අප පිය වඳිමු හැම කල

17. නොයෙක් කරදර විඳ
සැපක් ගැනුමට නොම හිඳ
දුකක් දැරු හැම සඳ
මවක් වැනි වෙන මෙ ලොව කවරෙද

18. ලබන තුරු දස මස
දුකින් දැරුවත් දරු කුස
දකින තුරු තම ඇස
කලණ මව්වරු වෙසෙත් සැප ලෙස

19. කුලුණු මෙත් වැඩුමෙන
එරුණු, කිරි ටික පොවමින
දරුණු දුක විඳගෙන
තියුණු නුවණින් වැඩු පණ මෙන

20. බොලඳ බස් කියමින
සුවඳ මල් ලෙස ඉඹිමින
ඇඟද තෙල් ගාමින
පැහැද මව්වරු වැඩු හැම දින

21. බොජුන් දී රස කර
සොඳින් නාවා නිදි කර
පෙමින් සුරතල් කර
මවුන් වැඩු අපි වඳිමු හැම වර

22. කිය නොහැකි දුක ගෙන
වැඩූ අප මව් පිය ගුණ
බඹ සුර නා විසින
කියා නිමවනු හැකිද කෙලෙසින

23. මහලු වී සිටියත්
රුවින් අඩු වී සිටියත්
දුප්පත්ව සිටියත්
දෙමව්පිය වැඳ පුදනු යහපත්

24. දෙමව්පිය කී යම්
වැඩක් ඇතහොත් කළ යම්
අත් නොහැර කර පෙම්
කරනු යහපති නොකර මැලිකම්

25. දෙගුරුන් ඉදිරියේ
උසක නොයිඳිනු සරියේ
එන සඳ ඉදිරියේ
නැඟිට වැඳලා සිටිනු සරියේ

26. වරද ඇති වූ විට
දඬුවම් දෙතී පෙම් කොට
එ ගැන මවු පිය හට
තරහ නොවඩා යටත් වෙනු සිට

27. මවුපියන්ගේ ගුණ
දැනෙයි නැතිවී ගිය තැන
මෙලොව අඳුරක් වන
මහත් විපතක් වේය දුක් දෙන

28. ඇත නැත තම වරද
පින් සිදු වෙන බැවින් සොඳ
උදෑසන සවස ද
වඳිමු මව්පිය දෙදෙන පෙම් බැඳ

29. හැදෙන විදි පෙන්වන
නුවණ වඩවන සතරින
සරණ දෙලොවට වන
කලණ බස් දෙන කෙනෙකි ගුරුතැන

30. මෙලොව පරලොව ගැන
යුතු බස් කියන කුළුණෙන
ගුරුන් වෙත බැතියෙන
පහත් ගතියෙන් වසනු අදරින

31. ගුරුන් දැක එන සඳ
තමන් උන් තැන නොම හිඳ
ගමන් පෙරටුව වැඳ
කරන් සැලකිලි අසුන් කර පුද

32. ගුරුන් සිත නොරිදනු
කීකරුකමින් පවතිනු
එකට එක නොකියනු
සතුටු මුහුණක් නිතර පෙන්වනු

33. ගුරුවරුන් නුඹහට
අණක් දුන් කළ වැඩකට
ඒ ගැන නුඹ පෙම් කොට
කරන් ඒ දෙය කියූ විලසට

34. වරද ඇතිවූ තැන
දඬුවම් දෙවති කුලුණෙන
එවිට නුඹ තරහෙන
ගුරුන් නොබලනු අවැඩ වෙයි දැන

35. තරුණ සිතකින් වත්
කුලගොත් උඩඟුවෙන් වත්
ඉසුරු බවකින් වත්
ගුරුන් නොතකා ඉඳුම නොහොබිත්

36. ගුරුවරුන් සැර කොට
නුඹෙන් සිදුවන වරදට
දඬුවමක් දුන් විට
ගොසින් නොකියනු ගෙදර තරහට

37. ගුරුන් ගුණ සලකනු
අසුන්වල සම නොයිදිනු
සැරෙන් බස් නොකියනු
සොඳින් කරුණා සතුට ලැබ ගනු

38. පෙමින් සත දැන ගනු
එමෙන් තුන් දොර රක ගනු
ලොවින් තුති ලැබ ගනු
ගුරුන් දැක වැඳ කමා කරගනු

39. දනුමැතියන් දෙන බස අහපන්නේ
වැඩිහිටියන් දුටු විට නැමියන්නේ
සොඳ මිතුරන් සහ දවසැරපන්නේ
ගුරුවරයන් වෙත යටක් වෙයන්නේ

40. මවුපිය දෙදෙනට සලකාපන්නේ
හිරිහැර කෙරුමට සිත නොම ගන්නේ
බණිමින් පාරට පැන නුදුවන්නේ
දවසින් දවසට දැන හැදියන්නේ

41. මහලු අයට සරදම් නොකරන්නේ
විහිළුකමට ගල් මුල් නොගසන්නේ
යහළු කමට ඔලගුව නා දින්නේ
මහලු අයට කරුණා කරපන්නේ

42. මවුපිය වරදක් පිට නොකියන්නේ
තිබුණත් වරදක් සැර නොකරන්නේ
උඹලගේ වරදක් ගැන නොකියන්නේ
ගැසුවෙත් පාරක් ගෙට වැදියන්නේ

43. වටපිට නොබලා බස් නොකියන්නේ
වරදට දඬුවම් ඉවසාපන්නේ
ගෙදරට නැවිත් පිට නොසිටින්නේ
තරහට රට ගම හැර නුදුවන්නේ

44. කඩපිල්වල තැවෙමින් නොයිදින්නේ
දෙරකඩවල ඉඳ කැම නොකන්නේ
තොටුපළපල දැවටී නොයිදින්නේ
පිටතැන්වල රෑ නිඳා නොගන්නේ

45. රහස් කියන තැන්වලට නොයන්නේ
දොසක් කියන විට තරහ නොවන්නේ
යමක් කියන විට කෑ නොගසන්නේ
හොඳින් කියන කල අසා සිටින්නේ

46. පලක් නැතිව පාරෙහි නොසිටින්නේ
දඟක් නැතිව පාරෙහ පලයන්නේ
බයක් ඇතුව රෑ එළි නොබසින්නේ
කෙනෙක් නැතුව නෑමට නොමයන්නේ

47. නිදිමත ඇති විට කෑම නොකන්නේ
නිදිමත නැති විට පොත් කියවන්නේ
කුණුකැත සිහිකොට කෑම නොකන්නේ
යහපත සිහිකොට නින්දට යන්නේ

48. ලෙඩක් හැදුණු විට රැකී සිටින්නේ
යමක් ඉඳුල් කර පිටට නොදෙන්නේ
ලෙඩෙක් දැක්ක විට බයක් නොවන්නේ
ලෙඩෙක් ඉන්න තැන දුකින් නොයින්නේ

49. ඇඟ වැසුමෙන් නිසි ඇඳුම් අඳින්නේ
බඩ නෙරුමෙන් රෙදි ඇඳ නොම ගන්නේ
හිස වැසුමෙන් කිසි තැන නොවදින්නේ
සුදුසු තැනින් නිසි ලෙස පලයන්නේ

50. ඇඳුමට වැඩි වියදම් නොකරන්නේ
වැඩි කොට ඇඳුමුත් ඇඳ නොම ගන්නේ
ගමනට ගෙදරට එක නාඳින්නේ
වයසට පමණට ඇඳුම් අඳින්නේ

51. ගේ වට කුණු ගොඩවල් නොතියන්නේ
එළි කොට වත්ත ද සාදා ගන්නේ
සිහි කොට වැට කඩුලුත බැඳපන්නේ
හරකට ගස කොළ ඇර නොතියන්නේ

52. ඉලපත ගෙයි එළිපිට නොතියන්නේ
එළිපත උඩ ඉඳ කෑම නොකන්නේ
පැන් නැති ගේ තුළ රෑ නොනිදන්නේ
දොස ඇත ගෙයි මැද එළි ගෙනයන්නේ

53. කුණු ගොඩවල් ගෙයි මුළු නොකරන්නේ
උදලු ඉදල් දොරකඩ නොතබන්නේ
ඌරු කුකුළු කොටු ගෙට නෑදන්නේ
හුඹස් ගෙවල් ළඟ වසා දමන්නේ

54. කිලිටු ඇඳුම් එළිපිට නොතියන්නේ
කිලිටි ඇඳුම් ගෙන බඩු නොපිසින්නේ
ඉරුණු ඇඳුම් අඳගෙන නොයිදින්නේ
විහිළු ඇඳුම් ඇඳ ගමන් නොයන්නේ

55. ලබන්ට සැප හැම දෙන තුටු වන්නේ
විඳින්ට හිරිහැර සතුටු නොවන්නේ
අනුන්ට දුක් දී තම නොරැකෙන්නේ
තමන්ට යුතු වැඩ සපයා ගන්නේ

56. දූප්පත් නෑයන් සලකා පන්නේ
පරඬැල් විලසින් එම නොසිතන්නේ
සරදම් කරමින් දුරු නොකරන්නේ
හිඟමඟ බලමින් සනසාපන්නේ

57. අසරණයන් දැක පිහිට වෙයන්නේ
වැඩකරුවන් හිරිහැර නොකරන්නේ
දුගී මගීන් එන සනසා දෙන්නේ
බියවූවන් සිත බය දුරලන්නේ

58. උසුළු විසුළුවෙන් බස් නොකියන්නේ
වටපිට බලමින් ඉඟි නොකරන්නේ
කොක් හඬ පාමින් සිනහ නොවන්නේ
කී දෙය අහමින් දවසැරපන්නේ

59. ආගම ගැන වාදය නොකරන්නේ
පව් හැම දුරුකර පින් කරගන්නේ
නිතරම සිත පිරිසිදු කරගන්නේ
ආගම එමයයි පඬි බස වන්නේ

60. දෙගුරුන් කීවත් පව් නොකරන්නේ
සතුරන් කීවත් පින් කරපන්නේ
කවුරුන් කීවත් විමසා ගන්නේ
එබැවින් යහපත් වැඩ කරපන්නේ

61. අයුතුකමින් වැඩ නම්බු නොවන්නේ
නම්බු ලෙසින් වැඩ සලසා ගන්නේ
කී විලසින් වැඩ දැනුමැතියන්නේ
කර ගනිමින් වැඩ සිදුකර ගන්නේ

62. සොඳුරු සැප වේවා
උතුරු ගුණ වැඩි වේවා
මහරු බල වේවා
මෙදරු පෙළහට ජයක් වේවා

# සිරිත් මල්දම ( 3 කොටස )

01. සැමට සෙත් වඩවන
සිරිත් මල්දම බලමින
සිරිත් හොඳ දැනගෙන
මහත් යසසිරි ලබනු දෙලොවින

02. වැඩක නොයෙදූ සිත
නරක අතටම පෙරළෙත
කිමෙක වන යහපත
වැඩක එබැවින් යොදනු තම සිත

03. කටයුතු කිරීමය
නොකටයුතු නොකිරීමය
අණ පිළිපැදීමය
මෙතුන් ගුණ දියුණුවේ මගමය

04. මොරන වී කරල
නැමෙයි රස වැඩිවෙන කල
නුවණ මෝරන කල
එමෙන් දරුපෙළ නැමෙයි මනකල

05. බඩු පිරෙන තරමට
ගිලෙයි නැව සමුදුර පිට
ඉසුරු වැඩි වෙන විට
උඩඟු නැති අය පවති එලෙසට

06. කසල ගොඩ තිබුණත්
මැණික් අනගිය සිරිමත්
එමෙන් සුලුදන පුත්
උතුම් වෙයි හොඳ සිරිත් දැරුවොත්

07. නමින් පටබැන්දත්
රනින් රුවනින් දිලුණත්
කුලෙන් රජ වූවත්
එයින් පල කිම සිරිත් හැරියොත්

08. කුලේ ඇති මහතය
කැලේ යන බව නියතය
බලේ හොඳ සිරිතය
දිලේ සඳලෙස දෙලොව සැපතය

09. උසස් කුල උපන්නත්
දහස් ගම් බිම් තිබුණත්
පිරිස් බල සිටියත්
උසස් නැත සිප් සතර නැතහොත්

10. පහත් කුල උපතත්
නැතත් රුසිරු පෙනුමත්
උගත් සිප් ඇතහොත්
පුදත් රජවරු පවා සැක නැත්

11. පිරෙන තෙක් විසි වස
ඉගෙන ගැනුමෙහි සිටි යස
පිරුණු කලතිස් වස
තරුණ පෙළ බැබළේය ගරු ලෙස

12. ගුරු වදන මහිමය
ගරු කර ගැනුම යුතුමය
සරු බවට මගමය
බොරු නොවෙයි පෙර මඬිහු බසමය

13. ගුරුන් ගුණ මහතය
දෙගුරුන් ගුණ ද මහතය
මෙකී ගුණ මහතය
සැලකු අයහට මහත් සැපතය

14. හොඳින් හැදූ දරුවන්
මව්පියො වාසනාවන්
තම මව්පිය රුවන්
පිදූ දරුවොද වාසනාවන්

15. ගෙදොර සැම කටයුතු
හොඳින් සලකා කළයුතු
කීවට නොකළයුතු
කරුණු සතුටින් බලා කටයුතු

16. නිසි පිළිවෙල රැගෙන
සියුම් පිරිසිදුකම ගෙන
ඇද නැති ගතිය ගෙන
සියලු වැඩපල කරන් සතුටින

17. ගතහැකි දෙය වැඩට
අහක නොදමනු කිසිවිට
වැඩ නැති දෙය නුඹට
දෙනුව ඉන් වැඩ ගන්න අයහට

18. සුළු වරද කෙරුමෙන
මහත් වැරදිත් වෙයි දැන
සුළු වරද සුළු මෙන
සිතා නො ගනින් මතු බලා ගෙන

19. හරි දෙය වැරදි ලෙස
වැරදි දෙය හරි දෙය ලෙස
පිළිගැනුම තද දොස
එයින් විපතක් වේය අපහස

20. කළ වරද යට කර
බොරු බස් කියන මැරවර
එක වරද දෙක කර
මහත් හිරිහැර ලබයි වැඩිපුර

21. වරද නොම දන්නා
කීවට පිළිනොගන්නා
අපා ගති වන්නා
අසයි ගුණ දොස් සුගති වන්නා

22. කිසිවක් පටන් ගෙන
එහි හරි වැරදි ඇසුමෙන
පලක් නැති බව දැන
අසනු මුලදිම හිතැති අය ගෙන

23. තම අත තම හිසට
අන් අත නොවෙයි හැම විට
නිතින් එය සිහි කොට
කරනු වීරිය හොඳින් හැදුමට

24. තම දොස මෙහෙවර මෙන් ගොඩ වූවත්
අන් දොස අබ ඇට මෙන් සුළු වූවත්
තම දොස නොපෙනී අන් දොස පවසත්
එම දොස මහ විපතින් ඔහු වැනසෙත්

25. තම ගති නුහුරට පමුණගත් විට
එළඹෙති විගසට හැම දොස සත හට
හොඳ ගති නරකට හැඟීයයි ඔවුනට
හිත ඇති අයහට නුරුසත් එම විට

26. අනුන්ගෙ යසසට මසුරු කෙරේ නම්
තමන්ගෙ යසසට මයි අනතුරු නම්
තමන්ගෙ පණකොට ලොව සලකා නම්
ඔවුන්ගෙ දෙවිකොට පෙනෙයි තමා නම්

27. කළ ගුණ සලකන අය දෙවියන් වැනි
කළ ගුණ නොතකන අය රකුසන් වැනි
මෙම බණ දැන ගෙන සියපණ විලසිනි
කළ ගුණ අය දැන සලකනු බැතියෙනි

28. මුහුණ ද අත පය සෝදා ගන්නේ
ඔලුව ද තෙල් ගා පීරා ගන්නේ
කිලිටු ද වැරහැලි ඇඳ නොම ගන්නේ
හැමසඳ පිරිසිදු ලෙස සිට පන්නේ

29. දොරකඩ ඉඳගෙන කතා නෙවන්නේ
එළිපිට සිටගෙන රෙදි නාඳින්නේ
ගෙන්පිට සිටගෙන හිස පීරන්නේ
අවරණ ඇති තැන නිදා ගනින්නේ

30. ඉණ රෙදි අඳිමින් පාරෙ නොයන්නේ
රෙදි හඬ නගමින් පා නොතබන්නේ
තමරුව බලමින් උඩඟු නොවන්නේ
හැඩ නිල බලමින් ගමන් නොයන්නේ

31. රේස් ගොනුන් බැඳගෙන නුදුවන්නේ
පොර කුකුළන් ගෙන පොරට නොයන්නේ
දුව පනිමින් ලොතරැයි නොකරන්නේ
අයුතු මගින් සෙල්ලම් නොකරන්නේ

32. පාරෙහි තැන තැන කටු නොතබන්නේ
කඩුලු තිබෙන තැන උල් නොතබන්නේ
සතුන් යනෙන තැන මඳු නො තබන්නේ
ඉන් ඔවුනට වන දුක සලකන්නේ

33. ඉරටි කෙමෙන් හැඳුමට නුදුවන්නේ
බිලි බාමින් තැන තැන නොසිටින්නේ
දුවපනිමින් හුලුමන් නොකොටන්නේ
බොර කරමින් වලවල් නොඉසින්නේ

34. යහපත් වැඩ ඇති තව අහපන්නේ
වැදගත් අය දැක නම්බු කරන්නේ
දුටුවන් මගකදි සිට නැමියන්නේ
කීවත් 'තෝ', 'බොල' තරහ නොවන්නේ

35. අනුන්ට බුහුමන් දී සලකන්නේ
තමන්ට බුහුමන් ලැබෙයි එයින්නේ
අනුන්ට තම වංසය කියමින්නේ
ලබන්ට නම්බුව නොසිතාපන්නේ

36. එක ම වැඩක නිතරම නොයෙදෙන්නේ
වෙන ම වෙන ම වැඩ සලකා ගන්නේ
පෙනුම ඇතුව හොඳ වැඩ කරපන්නේ
තරම නොදැන වැඩකට නොබසින්නේ

37. දුදනන් දැකලා මඟ හැරපන්නේ
සුදනන් දැකලා මඟ නාරින්නේ
උතුමන් දැකලා දුන් බස ගන්නේ
ඉහළින් පැනලා බස් නොකියන්නේ

38. උතුමන් ඉදිරියෙ කෙළ නොගසන්නේ
ඉදිමින් එහි පා දිගු නොකරන්නේ
එලෙසින් ඉඳ ඇනුම් නාරින්නේ
සියතින් එලෙසම හිස නොකසන්නේ

39. ගතු ඇසු පමණින් බාර නොගන්නේ
සිතු ලෙස සොයමින් අදහා ගන්නේ
ගතු බොරු කියමින් ලොව නොනසන්නේ
සිතු දොස තරමින් තම නොනැසෙන්නේ

40. බයෙන් තැවුල් අය ළඟ නොනිදන්නේ
දිරූ ගෙවල් ගස් ලඟ නොසිටින්නේ
පාළු ගෙවල් ළින් ළඟ නොසිටින්නේ
දෙමැද දවල් තනි මග නොමයන්නේ

41. මල මූ ඇති තැන අවරණ වන්නේ
තැන තැන සිටගෙන නුසුදුසු වන්නේ
මග වෙත ඉඳ ගෙන නොහොබි සිතන්නේ
කී විදි දැන ගෙන පිළිපැදපන්නේ

42. කෑමක් යමෙකුට සතුටින් දෙන්නේ
පෙනුමක් ලෙස නිසි බඳුනක දෙන්නේ
කෑමක් කන තැන කෙළ නොගසන්නේ
තරහක් වී එහි කෑ නොගසන්නේ

43. සුරුට්ටු බීමෙන් හදවත විස වෙයි
ඇඟපත දිරුමෙන් කට ගඳ ඇති වෙයි
මත් ගතිවීමෙන් නුවණ ද අඩු වෙයි
කැස්සද සැදුමෙන් ආයුස කොට වෙයි

44. දුම්කොළ හැපුමෙන් දත්මුල් කුණු වෙයි
කටගඳ වීමෙන් වස පිළිකුල් වෙයි
කෙළ වැගිරීමෙන් දිව රස අඩු වෙයි
බල අඩු වීමෙන් සිහිය ද මඳ වෙයි

45. බුලත් විකීමෙන් දත්මුල් කැත වෙයි
දිව රළු වීමෙන් හඬ අම්හිරි වෙයි
කට කැත වීමෙන් ඇඳුම් ද කැත වෙයි
වැඩ පසු වීමෙන් කාලෙ ද නැති වෙයි

46. මත්පැන් බීමෙන් ලේ කෝපය වෙයි
වෛරීමත් වීමෙන් සිහි විකලය වෙයි
බල අඩු වීමෙන් නෙත ලෙඩ ඇති වෙයි
දුප්පත් වී මෙන් අකල් මරණ වෙයි

47. ඇත්ත නැත්ත නැති ඇති කර පැවසීම
සත්ත නොවන බස වෙයි ඒ බොරු කීම
පැත්ත උතුම් වැනසෙයි ලොව දොසින් එම
ඇත්ත නිතර පවසනු දොලොවෙහි මහිම

48. කැමට බොහොම පළතුරු ඇත තැනින් තැන
සැපයට නිතර හිත වෙයි ඒ රස බොජුන
ලොබ කොට සතුන් නො මරනු මස් කෑම ගැන
සතහට දුකක් දී තම රැකෙනු ද යෙහෙන

49. දුක් ගෙන දනෝ රෑ දාවල් වෙහෙසෙමින
සපයන දෙයට ලොබවෙති සැප පතා ගෙන
සියපණ ලෙසට සලකා එම දනන් ගැන
පව් දැන සොර සිතින් නොගනුව එකී දන

50. බීමට අපට පැන් ඇත මිහිපිට සොඳට
සැපයට සිතා මත්පැන් විස බොනු කුමට
වද යට දොලොව පැමිණෙයි ඒ පව්කමට
ලොබ කොට නො බොනු මත් පැන් කිසිකල සැපට

51. ලොබකර දන මිලට දියුණුව පතා ගෙන
ගොරතර අවමඟට තුන්දොර නමා ගෙන
කරදර අන් අයට කරමින් තැනින් තැන
හිරිහැර සුදුවට නො බසිනු අවැඩ දැන

52. හිසකේ විදාගෙන යම් තැනකට නො යමී
හිසකේ විදාගෙන උතුමන් වෙත නො යමී
හිසකේ විදාගෙන දොරකඩ නොම ඉඳිමී
හිසකේ විදාගෙන සබමැද නොගැවසෙමී

53. මසුරු ගුණැති නො සිරිත් අය සැම වර
සිදුරු සොයති ගුණවත් අය දැක පවර
සොඳුරු ගුණැති යහපත් අය කිසිම වර
මසුරු නොවෙති ගුණවත් අය දැක පවර

54. නොසිරිත් ලෙසට කල් අරිනා අය නිතින
හරහත් යසට හැසිරෙන උතුමන්ට බැන
ගුණවත් අයට දොස් පවරා පව් නො ගෙන
යහපත් ලෙසට හැසිරෙනු උතුමන් ඇඳින

55. සොඳ ගුණ කියා පෙරමුණ බැහැරට ගොසින
ඇති ගුණ මකා නැති ගුණ ලොව පළ කරන
යස ගුණ මකා අවගුණ සිරිතට හැදෙන
මොහු ගුණ බලා බේරෙන ලෙස ගනු ඇඳින

56. සතුටින් යමෙකු කැමක් දුන් විට බැතින
කියමින් එහි දෝස කනු හොඳ නැත පෙනුන
එලෙසින් අනුන්ගේ දේවල් කිසිත් ගැන
සොයමින් දෝස කීම ද නොහොබී සිතින

57. අනුවණ උඩඟු අයගේ ගතියක සැටිය
ලැබගෙන පිහිට උතුමන් නොතකන සැටිය
දෙ නුවන විලස සලකා වැඩු ඇති සැටිය
සසොබන මහතුන්ට එම සලකනු වටිය

58. හිත ඇතියන් දෙන බස් නො අදහන සත
තම සතුරන් සිත් තොස් වඩවයි සතත
අවගතියෙන් ගුණ දොස් නොදැනෙයි නියත
එම විපතින් සැම දොස් පැමිණෙයි සියත

59. දෙගුරුන් ගුරුන් දුටු දෙවියන් ලෙස සිතමු
උතුමන් බසින් ඉටු දෙවියන් දැන ගනිමු
එබැවින් නිතින් මේ දෙවියන් වැඳ ගනිමු
බැලුමෙන් හොඳින් ගුරු දෙගුරුන් රැක ගනිමු

60. මවුපිය ගුරුන් වැඩිහිටියන් උතුමන්ද
පැවිදි උතුමන්ද සිල්වත් සුදනන්ද
සැළකිය යුතු මෙකී අය ඉදිරි එන සඳ
වඳිනු ය නැගිට ගරු බුහුමන් ලෙස පැහැද

61. වැඩුනොත් යමෙක් නිසි ගුරු අවවාද ගෙන
සැපවත් කෙනෙක් වනු නියතයි පඬි වදන
එපවත් සිතට ගනිමින් දියුණු වන මෙන
යහපත් ලෙසට හැසිරෙනු ගුරු වදන ගෙන

62. සමා සිත් වේවා
හැමා දොස් දුරු වේවා
මෙමා සිතු වේවා
ළමා පෙළහට ජයක් වේවා